# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2028/8 - 2017 ජූලි මස 18 වැනි අඟහරුවාදා - 2017.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2017 අංක 867/1

**කාර්මික ආරවුල් පනත (131 වන පරිච්ඡේදය)**

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් මාලාවේ (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන පරිච්ඡේදය වූත්, 1957 අංක 14 හා අංක 62 සහ 1962 අංක 04 දරන කාර්මික ආරවුල් (සංශෝධිත) පනත්වලින් සංශෝධිත වූත්, [1968 අංක 39 දරන කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන] කාර්මික ආරවුල් පනතේ 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම,

(1) කාර්මික අධිකරණයක් සංස්ථාපනය කිරීමට තෝරාගත යුත්තන් අඩංගු මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් මෙයට අමුණා ඇති උපලේඛනයේ නම් සඳහන් පුද්ගලයින් මෙයින් පත් කරමි.

(2) එම සාමාජිකයින්ගේ ධූර කාලය 2017.06.13 වැනි දින සිට වර්ෂ තුනක කාල පරිච්ඡේදයක් ලෙස ද මෙයින් නියම කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 ජූලි මස 17 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | | |
|---|---|---|
| 1. | කේ. එම්. සරත්චන්ද්‍ර මහතා | නීතිඥ |
| 2. | පී. දනන්සූරිය මහතා | නීතිඥ |
| 3. | ටී. ඊ. සාන්තරාජන් මහතා | නීතිඥ |
| 4. | ආර්. එස්. ආරියප්පෙරුම මහතා | නීතිඥ |
| 5. | සුගතදාස කාරියවසම් මහතා | නීතිඥ |
| 6. | ලොයිඩ් ගල්හේන මහතා | නීතිඥ |
| 7. | පී. නවරත්න මහතා | හිටපු සහකාර කම්කරු කොමසාරිස් |
| 8. | සරත් ලියනගේ මහතා | නීතිඥ |
| 9. | ටී. පියසෝම මහතා | නීතිඥ |
| 10. | කේ. ඒ. ටී. ප්‍රනාන්දු මහතා | නීතිඥ |
| 11. | සුනෙත් ලොකුබෝගහවත්ත මහතා | නීතිඥ |
| 12. | එස්. විරිතමුල්ල මහතා | නීතිඥ |
| 13. | ඕබඩගේ ලීලාරත්න මහතා | නීතිඥ (හිටපු වැඩබලන කම්කරු කොමසාරිස්) |
| 14. | එච්. එම්. අනුලාවතී මෙනවිය | නීතිඥ (හිටපු නියෝජ්‍ය කම්කරු කොමසාරිස්) |
| 15. | එල්. ආර්. සුමතිපාල මහතා | නීතිඥ (හිටපු සහකාර කම්කරු කොමසාරිස්) |
| 16. | නන්දසේන බැදිගම මහතා | නීතිඥ (හිටපු සහකාර කම්කරු කොමසාරිස්) |
| 17. | එස්. ජී. සූරියආරච්චි මහතා | නීතිඥ (හිටපු සහකාර කම්කරු කොමසාරිස්) |

08 - 50


1A - G 25908 — 367 (2017/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.